දුර්ලභ

## පෙරවදන

මෙම නිබන්ධනය ලංකාවේ බෞද්ධ පරමවිඥානාර්ථ ව්‍යාපාරය හා සිංහල ශාස්ත්‍රීය පුනර්ජීවනය අළලා කරන ලද පර්යේෂණයකි. අප මුලින්ම මෙම පර්යේෂණයට යොමුකළේ ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙහි කලා පීඨාධිපති හා ඉතිහාස මහාචාර්යව සිටි අභාවප්‍රාප්ත වූ හේමචන්ද්‍ර රාය මහතාණන්ය.

මෙම පර්යේෂණයේ දී ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ කලා පීඨාධිපති හා ඉතිහාස මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද මහතාණන් අප ධෛර්යමත් කරමින් දෙන ලද අගනා උපදෙස් බොහෝ ප්‍රයෝජනවත් විය.

පර්යේෂණ නිබන්ධනය සකස්කිරීමේ දී අපගේ උපදේශකවරයා වූයේ ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයේ කථිකාචාර්ය, ආචාර්ය ඩබ්ලිව්.ඇම්.ඩී.ඩී. අඳාදි මහතාණන්ය. මෙහි එන සෑම පරිච්ඡේදයකම අත්පිටපත ඒ මහතාණන් ඉතා සුපරීක්ෂාකාරීව කියවා බලා උපදෙස් දුන්හ. එතුමාගේ ධෛර්යගන්වන සුළු විවේචනවලින් අඩුපාඩු බොහෝදුරට මගහරවා ගැනීමට හැකිවිය. එබැවින් මෙහිලා හැම විටම එතුමන්ට ණයගැති බව පළකරමු.

රාජ්‍ය ලේඛනාගාරයෙහි ඇති සිංහල හා ඉංග්‍රීසි ලිපිලේඛන පරීක්ෂාකර බැලීමට එහි අධිකාරි මහතුන්ගේ කාරුණික අවසරය නිසා හැකිවිය. සහකාර රාජ්‍යලේඛනාගාරක්ෂක ජයතිස්ස වරාගොඩ හා ඇම්.යූ. ද සිල්වා යන මහතුන්ගෙන් රාජ්‍ය ලේඛනාගාරයේ ලියවිලි සොයාගැනීමට උපකාර ලැබුණි. දොඩන්දූවේ ශෛලබිම්බාරාමයෙහි ඇති ලියවිලි පරීක්ෂාකර බැලීමට අවසර ලබාදුන්නේ දොඩන්දූවේ ධම්සේන හිමියන්ය. මොරටුවේ ශාසනරතන හිමිපාණන් සමග කරන ලද සාකච්ඡාවලින් ඇතැම් ගැටළු නිරාකරණය කරගැනීමට හැකි විය. මුල්ලපිටියේ කේ.එච්. ද සිල්වා මුහන්දිරම් මහතා සහ සී. ඩබ්ලිව්. සේනාධීර මහතා සමීපයේ තිබුණ සමහර පුද්ගලික පොත්පත් ඒ මහතුන්ගේ කාරුණික අවසරය නිසා කියවා බැලීමට පුළුවන් විය.

මෙය හැකිතාක්දුරට නිවැරදිව ටයිප් කරදුන් ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ඊ. ඇම්. ආරියසේන මහතාටද අපගේ ස්තූතිය හිමිවේ.

12 ✓

මෙයට,

ආර්. ඩී. ගුණවර්ධන

1968 ඔක්තෝම්බර් 4 දා.